THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 1 - Issue I
December 2021

TJOLC
ISSN 2806-5395

Category: Research Article

# ලක්දිව නාග ජනයා පිළිබඳ ඓතිහාසික සහ සාහිත්‍ය විමර්ශනයක්

**ඩබ්. එම්. කල්‍යාණි විජේසුන්දර**

**ARTICLE DETAILS**

Published Online & Printed

December 2021

***Author:***

ඩබ්. එම්. කල්‍යාණි විජේසුන්දර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල අධ්‍යයනාංශය,
කොළඹ විශ්වවිද්‍යාලය.
*Email: kalyani@sinh.cmb.ac.lk*

***Keywords:***
Naga people, pre-Brahmin, inscriptions, literary works, Myth, Historical significance

## Abstract

The early people of Ceylon lived in their own areas as Yaksha, Naga, Raksha and Deva tribes. Of these, historical and literary sources on the Naga kings and the Naga people, such as Chulodara, Mahodara and Maniakhika, can be traced back to the times when the Buddha visited Ceylon. The aim was to find information about the Naga people in the early pre-Brahmin inscriptions and literary works from the historical source. Under the qualitative research methodology, bibliography, ie the written source, was used to gather data. Although scholars and critics have sometimes sought to dismiss such incidents as fiction or myth, it is clear that certain events are of historical significance when considering historical and literary evidence.

## හැඳින්වීම

ලෝකයේ අනෙකුත් රටවල මෙන් ම ලංකාව නම් වූ භෞමික සීමාව තුළ ද මානව සමාජ ඉතිහාසයේ දැකිය හැකි වූ විවිධාකාර බෙදීම් පැවති බව අවිවාදිත කරුණකි. මෙම බෙදීම්වලට පාදක වූ හේතු බොහොමයක් පවතින්නට ඇතැයි සිතිය හැකි වුව ද ඒ හේතු අතර පොදු ලක්ෂණ ද පැවති බව පෙනේ. භාෂාව ආදී සංස්කෘතික කරුණුත්, ජීවනෝපාය ක්‍රමත් පොදු බෙදීම් රේඛා සනිටුහන් කළ බව සිතිය හැකි ය. වසර දහස් ගණනක් තරම් ඈතට දිවෙන මෙම සමාජ බෙදීම් සමාජ විපර්යාසයන්ට අනුරූපි වෙමින් ද ප්‍රතිරෝධී වෙමින් ද අවිච්ඡින්න ව පැවත එන බවට ඓතිහාසික තොරතුරු සාක්ෂ්‍ය දරයි. ප්‍රාග්-ඓතිහාසික යුගයේ පටන් වරෙක මතු වෙමින් ද වරෙක යටපත් වෙමින් ද පැවත ආ මෙම බෙදීම්, විවිධ භාෂා හා සංස්කෘතිකාංග ආදී මානව ශිෂ්ටාචාරයට මහඟු දායාද මතු නොව ශිෂ්ටාචාරයට තරම් නොවන බේදවාචක ද උරුම කර දී ඇත.

ලාංකික මෙන් ම ලෝක ජන සමාජයේ වර්තමානයේ දැකිය හැකි ඇතැම් බෙදීම් මෙම ඓතිහාසික හෝ ප්‍රාග්-ඓතිහාසික සමාජ බෙදීම්වල දිගු වශයෙන් පවතින ඒවා බව ඉතිහාසය විශ්ලේෂණය කිරීමේ දී පෙනී යයි. සමාජ බෙදීම් අහෝසි කිරීමේ කතිකාවන් භාවිතයට ගැනීම් ද දැකිය හැකි වර්තමානයේ එම තත්ත්වයන් මානව සමාජය තුළ ඉතා සංකීර්ණතා නිර්මාණය කර ඇත. මෙය ලංකාවේ සමාජ තත්ත්වයට ද ඒ අයුරින් ම ආදේශ කළ හැකි බැවින් සමාජ බෙදීම්වල ඉතිහසාය විවරණය කිරීමේ අවශ්‍යතාව කාලෝචිත ය. මානව සංස්කෘතීන්ගේ විවිධ අංගයන්හි විකාශනයත් ඒවායේ අන්තර්සම්බන්ධයත් වර්තමාන තත්ත්වයන් හා ඒවායේ ඇති බැඳීමත් විශ්ලේෂණය කිරීම තුළින් එම සමාජ බෙදීම්වල මූලය සහ බෙදීම්වල නිර්මිතයන්ගේ මූලයත් සෙවීම කළ හැකි අතර ඒ මඟින් සමාජ, සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික ආදී ක්ෂේත්‍රයන්හි වර්තමාන තත්ත්ව විග්‍රහය පහසු කරවයි.

මිනිසා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම නාග වන්දනය සිදු කර ඇති බවට ද සාධක තිබේ. ග්‍රීසිය, මිසරය, චීනය, කාම්බෝජය වැනි රටවලින් ගලින් නිර්මාණය කළ නාගරූප හමු වී ඇත. ඉන්දු නිම්න ශිෂ්ටාචාර වැසියන් ද නාග වන්දනය සිදු කර ඇත. මොවුන් නාග පෙණයට සමාන ජටාවක් හිසෙහි පැළඳ සිටි බවත් නාගයන්ට වන්දනාමාන කළ බවත් සඳහන් වේ. මහිනාග දිවයිනෙහි, මහමෙර ආසන්නයේ, යමුනා ගංගාව යට සහ කැලණි ගඟ යට සතර නාග භවනක් ඇති බවට අදහසක් ඇත. මේ පිරිස් තමන්ගේ නමට මෙන් ම තමන් වාසය කළ ස්ථානවලට ද 'නාග' යන පදය භාවිත කළහ. 'නාග වංශිකයන්ගේ ශරීර ලක්ෂණ අනුව මොවුන් මොන්ගොලොයිඩ්වරුන්ගෙන් (Mongoloid) පැවත එන බවට' අදහස් ඉදිරිපත් කර ඇත (Rasanayagam, 1993, p.4).

මෙරට ජනයා පොදුවේ හෙළයෝ යනුවෙන් හඳුන්වන්නට වූහ. ලංකා පුරවරයේ ආදිම වැසියන් වන යක්ෂ, නාග, රාක්ෂ සහ දේව ගෝත්‍රිකයන් තම තමන්ට ආවේණික ප්‍රදේශ වෙන් කරගෙන ජීවත් වුව ද මෙම සිව් වර්ගය 'සිව් හෙළයෝ' යනුවෙන් හැඳින්විය. ක්‍රමයෙන් සුබෝච්චාරණය තකා, සිව් හෙළය > සී හෙළ > සීහළ > සිංහල යනුවෙන්

වෙනස් වූ බවට ද අදහසක් පවතී. අරිසෙන් අහුබුදු ද මෙම අදහස ඉදිරිපත් කරයි ( https://si.wikipedia.org/wiki). ඇතැම් විද්වත්හු යක්ෂ යනු ස්වදේශික ජන ගෝත්‍රයක් වශයෙන් ද 'නාග' යනු ආගන්තුක ජන ගෝත්‍රයක් වශයෙන් ද හඳුන්වති.

විභීෂණ කුමාරයාට ලංකාවේ ආදිවාසී යක්ෂ සහ රාක්ෂ ගෝත්‍රිකයන්ගේ සහය නොලැබුණු හෙයින් ඔහු නාග ගෝත්‍රිකයන්ගේ සහයෝගය ලබා ගනිමින් කැලණියේ රාජධානිය පිහිටුවා ගත් බව ඇතමෙක් විශ්වාස කරති. විජය ඇතුළු පිරිස ලංකාවට ගොඩ බැසීමෙන් අනතුරුව යක්ෂ ගෝත්‍රිකයන් සමග යුද කළ ද නාගයන් සමග විරෝධයක් තිබුණ බවට තොරතුරු සඳහන් වූ අවස්ථා හමු නොවන්නේ එකල නාග ගෝත්‍රිකයන් ප්‍රබලව විසූ ජන කොට්ඨාසයක් වූ නිසා විය හැකි ය. උතුරු, දකුණු, වයඹ සහ බටහිර ප්‍රදේශවල නාග ගෝත්‍රිකයන් පාලනය කළ රාජධානි ත්‍රිත්වයක් තිබීම ඒ බව තහවුරු කරයි. මෙමගින් ඇතැම් විට වක්‍රව නාගයන් විජය ඇතුළු පිරිසට උදව් කළා යැයි ද කෙනෙකුට සිතිය හැකි ය. යක්ෂ සංහාරයට අතිශයින් ප්‍රිය කළ නාගයන් ස්වකීය ඥාතීන් වූ උතුරු ඉන්දීය වාසින්ට උදව් වෙමින් ලක්දිව යක්ෂ බලය තුරන් කිරීමට සහයෝගය දක්වන්නට ඇතැයි ද තව අයෙකුට තර්ක කළ හැකි ය.

නාග ගෝත්‍රිකයන් විජය රජතුමාට පක්ෂග්‍රාහි වූ බවට අදහස් පළ වන අතර දුටුගැමුණු රජතුමාට දැඩි විරෝධයක් ප්‍රකට කළ බවට ද අදහසක් පවතී. මුදලි රාසනායගම් ඉදිරිපත් කරන තර්කයට දුටුගැමුණු රජතුමාට නාග ගෝත්‍රිකයන් දැක් වූ විරෝධය අවධානයට ගෙන තිබේ (Ancient Jaffna, 1960). ඔහු දක්වා සිටින්නේ නාගයන් යනු ද්‍රවිඩ ජාතියේ 'මූල ගෝත්‍රය' වශයෙනි. ලංකාවේ සොළී බලය මර්දනය කරමින් එළාර රජතුමා පරාජය කරමින් ලංකාව එක්සේසත් කළ දුටුගැමුණු රජතුමා කෙරෙහි නාගයන් වෛරී සහගත වන්නේ මේ නිසා යැයි ඔහු අදහස් කරන්නට ඇත. නාගයන් සතුව තිබුණ ඓතිහාසික වශයෙන් වැදගත් ම සම්පත වූ සර්වඥ ධාතූන් වහන්සේ දුටුගැමුණු රජතුමා රුවන්වැලි සෑ ධාතු නිදානෝත්සවයට වැඩමවීම තවත් ඔවුන් කෝප ගන්වන්නට හේතු වන්නට ඇත. දුටුගැමුණු රජතුමා සහ නාග ජනතාව ඇසුරෙන් නිර්මාණය වුණ ජනප්‍රවාදයක් මෙසේ ය.

> 'දුටුගැමුණු රජතුමා යුද්ධය ජයගෙන නාගදීපයට ගොස් එහි උයනක් ඉදිකළ අතර විවේකය ගත කිරීම සඳහා මෙම නාග උයනට පැමිණීම පුරුද්දක් වශයෙන් සිදු කළේ ය. මේ අතර එක් දිනක මෙම උද්‍යානයේ පාලක වූ 'ජයසේන' නමැති අයෙකු නාග පොකුණට බැස තරුණ නාග කන්‍යාවක සමඟ විනෝද වන ආකාරය දුටු රජතුමා ඇයව බලහත්කාරයෙන් ගෙන ගොස් ඇය සමඟ සංවාසයෙහි යෙදුණේ ය. උද්‍යාන පාලක ජයසේන නමැත්තා මේ සිදුවීම කෙරෙහි කෝප වී රජතුමා මරණයට පත් කිරීමට සූදානම් වුව ද අවසානයේ රජු අතින් ජයසේන මරණයට පත් වූ බවත් මියෙන්නට පෙර 'මම නාගයෙක් වී ඉපිද දෂ්ට කර නුඹව මරා දමමි'යි පැවසූ බවත් කියවේ.'

දුටුගැමුණු රජතුමා සෝණුත්තර තෙරුන් වහන්සේ නාග ලෝකයට යවා රුවන්වැලි සෑ ධාතු නිධානෝත්සවයට ධාතු වැඩම කරවාගත් බව ද ජනප්‍රවාදගත ය. රජතුමාට ජීවිතේ අවසාන කාලයේ නාගයෙකු දෂ්ට කළ බවත් ඒ මෙම ජයසේනගෙ ආත්මය බවත් ඇතැමුන් පැවසුව ද සරල උපකල්පන තුළින් මතවාදවලට එළඹීම සුදුසු නොවේ. කෙසේ වෙතත් දුටුගැමුණු රජතුමාට දෂ්ට කළේ නම් ඒ නාග වශයෙන් හඳුන්වන උරගයෙකු මිස නාග ගෝත්‍රිකයෙකු විය නොහැකි ය.

බුදුන් වහන්සේ ලක්දිවට වැඩම කරන විට යක්ෂ, නාග සහ දේව ගෝත්‍රිකයන් මෙරට වාසය කළ බව සඳහන් වේ. යක්ෂ ගෝත්‍රිකයන් මහියංගණයේ ද නාග ගෝත්‍රිකයන් උතුරු, දකුණු සහ වයඹ ප්‍රදේශවල ද දේව ගෝත්‍රිකයන් මධ්‍යම කඳුකරයේ ද වාසය කළ බවට සාක්ෂ්‍ය හමු වේ. මහියංගණයේ දී පළමු ලංකාගමනයේ දී යක්ෂ ගෝත්‍රිකයන් ද දෙවන ලංකාගමනයේ දී චූලෝදර, මහෝදර සහ මණිඅක්ඛික නාග ගෝත්‍රික රජවරුන් ද තෙවන ලංකාගමනයේ දී මණිඅක්ඛික රජතුමා සහ සුමනසමන් දිව්‍ය රාජයා ද හමු වූ ආකාරය පූජාවලිය විස්තර කරන්නේ මෙසේ ය.

> මේ ශ්‍රී ලංකාද්වීපය දැක 'ඒ දැන් **යක්ෂයන්ට** ම නිවාස වෙයි, දැන් ම මම ගොස් ඒ යක්ෂයන් ප්‍රලය කොට ශාසන ප්‍රතිෂ්ඨාවට ආධාරවන සේක් අරක්ගනිමි'යි සිතා ... මනිභේද දනව්වෙහි ලංකාංගනාව පලන් මුක්තාහරයක් බඳු වූ මහා වාලුකා නම් ගංගාව සමීපයෙහි දිග තුන් යොදුන්, පුළුල යොදුන් පමණ ඇති මහා නාගවන නම් ඒ උද්‍යානයෙහි කඳවුරු බැඳ අතුරු නොදී සතුරුව උන් මහා යක්ෂ කඳවුරට වැඩ ... **දෙමයිල් නාරජුන්** විසින් පිළිගන්වන ලද මිණිපලඟ මතුයෙහි වැඩ හිඳ, ඔවුන් විසින් ම පිළිගන්වන ලද දිව්‍යභෝජනය වළඳා, ... අසූ කෙළක් නයින් ශරණශීලයෙහි පිහිටුවා... එ කෙණෙහි දිව්‍යනාග රාජයන් බුදුන්ට පූජා කෝලාහලයෙන් පැළදිග් බැලූ සමනොල කුළ වසන **සමන් දෙවි** රජ්ජුරුවෝ 'අප බුදුමු අද ලක්දිවු වැඩි වන්හ... බුදුන් සහපිරිවරින් වැඳ දොහොත් මුදුන් දී සිට ... (පූජාවලිය 753 -754,

විල්හෙල්ම් ගයිගර් 'නාග' යනු දිව්‍ය කොට්ඨාසයක් යනුවෙන් චූලවංසයෙහි හැඳින්වුව ද මහාංවසාදි තොරතුරු අනුව ලංකාවේ වාසය කළ මිනිස් ගෝත්‍රයක් වශයෙන් ද ප්‍රකට වේ. මේ ගෝත්‍රිකයන්ගේ ප්‍රභවය පිළිබඳ විද්වතුන් අතර විවිධ අදහස් පවතී. අතීතයේ නාග ගෝත්‍රිකයන් වශයෙන් හැඳින්වූ මිනිස් කොට්ඨාසයක් හෝ තේජවන්ත උරග කොට්ඨාසයක් ගැන අපේ සාහිත්‍ය කෘතිවල ද සඳහන් වේ. නාග ගෝත්‍රිකයන් වශයෙන් හඳුන්වන්නේ නාගයන් වෙනුවෙන් වැඳුම් පිදුම් කළ අය යනුවෙන් ද තවත් අදහසකි. නාගයා යනු ජලයෙහි ආරක්ෂකයා වශයෙන් ද සශ්‍රීකත්වයේ සංකේතයක් වශයෙන් පුරාණ වැසියෝ විශ්වාස කළහ. ජලයට අධිපති වශයෙන් විශ්වාස කරන නිසා ලංකාවේ බොහෝ වැව්, රාජකීය පොකුණු වැනි ජලාශ්‍රිත ප්‍රදේශ ආසන්නයේ නාග රූපයක් විශේෂයෙන් පෙණ පහක් සහිත හෝ පෙණ හතක් සහිත නාග කැටයමක් දක්නට ලැබේ. මෙම නාග රූපය එම ස්ථානවල තිබීමෙන් සෞභාග්‍ය සහ ආරක්ෂාව සැලසෙන බව පැරැන්නෝ විශ්වාස කළහ. කුට්ටම්

පොකුණ, කළුදිය පොකුණ වැනි ස්ථාන මෙවැනි නාග කැටයම් පිහිටි ස්ථානවලට නිදසුන් වශයෙන් පෙන්වා දිය හැකි ය.

කැලණිය, නාගදීපය සහ වඩුන්නාගල යන ප්‍රදේශ නාගයන්ගේ රාජධානි වූ බවත් එකල ඒ ඒ රාජ්‍යය පාලනය කළේ නා රජවරුන් බවත් ග්‍රන්ථාගත ය. ඒ අතුරින් කැලණිය නාග ගෝත්‍රිකයන්ගේ ප්‍රබල මධ්‍යස්ථානයක් ව පැවති බවට 'විෂ්ණු පුරාණය'හි සඳහන් ව ඇත. නාගදීපය, වඩුන්නාගල සහ කැලණිය යන ස්ථාන නාගයන් වාසය කළ ස්ථාන යනුවෙන් සද්ධර්මාරත්නාකරයේ ද සඳහන් වේ ( 13 පරි. 302-303). වර්තමානයේ යාපා පටුන, කල්පිටිය සහ කැලණිය පිළිවෙළින් පුරාණයේ නාගදීපය, වඩුන්නාගල සහ කැලණිය නමින් හැඳින්වී ය. ප්‍රධාන රාජධානිය නාගදීපය වශයෙන් ද අනෙකුත් ප්‍රදේශ උපරාජධානි වශයෙන් පැවති බව ද සඳහන් ය. 'මධ්‍ය ඉන්දියාවේ කල්‍යාණියෙන් පැමිණි බවට සැකයක් නොමැති මෙහි විසූ ආදිතමයෝ නාග ගෝත්‍රයට අයත් වූහ. ... අද උප නගරයට සීමිත කල්‍යාණිය එදා මුළු ප්‍රදේශයට ම ව්‍යවහාර වූ පොදු නාමයයි. දඹදෙණි සමය තෙක් ම කල්‍යාණි දේශය ව්‍යවහාරයේ පැවති බව දඹදෙණි අස්නෙන් පෙනේ' (වනරතන, 1967, 57 පි.).

බුදුන් වහන්සේට දෙවන ලංකාගමනයේ දී මුණ ගැසෙන චුලෝදර සහ මහෝදර යනු නා රජවරු බව මහාවංසයේ ද මෙසේ සඳහන් වේ.

> ... මහෝදර නාගය එසේ ම චූලෝදර නාගය යන පිරිස් සහිත වූ නාගයන්ගේ මිණිපළඟ හේතු කොට එළඹ සිටියා වූ යුද්ධය දැක බක්මහ අමාවක් පොහෝ දින උදය කාලයෙහි ම උතුම් වූ පා සිවුරු ගෙන නාගයන්ට අනුකම්පා පිණිස නාගදීපයට වැඩි සේක... (1.පරි. 45-48 ගාථා). 'මහෝදර නම් නාග තෙමේ මුහුද පන්සියයක් යොදුන් අයම් නාග භවනයෙහි රජ වී ... (1.පරි. 49 ගාථා). එසේම බටහිර ප්‍රදේශයේ ද 'මහෝදර නම් නාගයාගේ මයිල් වූ මණිඅක්ඛික නම් වූ කැලණියෙහි නා රජ තෙම යුද කරනු පිණිස එහි ගියේ ය (1.පරි. 63-64 ගාථා)

කැලණියේ සහ නාගදීපයේ නාග ජනතාව වාසය කළ බව බොහෝ මූලාශ්‍රයන්හි සඳහන් වේ. චූලෝදර (කුඩා උදරයක් ඇති) නම් නාග රාජයා වඩුන්නාගල ප්‍රදේශයේ ද කැලණි ගඟ අසබඩ ප්‍රදේශයේ මණි අක්ඛික (මැණික් බඳු ඇස් ඇති) නම් නා රජතුමා ද සමුද්‍රනාග නම් භවනයෙහි මහෝදර (විශාල උදරයක් ඇති) නම් නාග රාජයා ද වාසය කළහ. මෙරට ස්වාභාවික සම්පත් බහුල ප්‍රදේශ ආශ්‍රිතව නාග ජනතාව ජනාවාස පිහිටුවා ගෙන සිටි බවට ද අදහසක් ඇත.

> තහිමතිරුචිරස්මිං වඩ්ඪමානාදි සෙලෙ
> මධුරසලිලවාහෙ රම්මකල්‍යාණිකාදො
> උද්ධිභුජගවාසෙ නාගදීපන්තිකේ ච
> මහති මහිමයුත්තා නාගසඞසා වසන්ති
>
> (සමන්තකූට වණ්ණනාඃ554 ගාථා)

පවුරමහිමයුත්තො වඩ්ඪමානාවලස්මිං
අධිපති භුජගානං ආසි චූලොදරව්හො
මහුදර ඉති නාමො නාගදීපොධිම්හි
නිවසති අථ තෙසං පබ්බතෙය්‍යො'රගිනො
(සමන්තකූට වණ්ණනාඃ 55 ගාථා)

සමන්තකූට වණ්ණනාවෙහි ද මේ ආකාරයට වර්ධමාන පර්වතය ආදීන්හි ද මිහිරි ජලය ඇති කැලණි නදී ආදීයෙහි ද නාගදීපය ආසන්නයෙහි ද මහත් වූ සමුද්‍ර නාග භවනයෙහි ද ආනුභාව සම්පන්න නාග සමූහයෝ වාසය කරන බවත් වර්ධමාන පර්වතයෙහි බොහෝ ආනුභාව සම්පන්න චූලෝදර නම් වූ නාග රාජයෙක් සහ නාග දිවයින සමීපයෙහි වූ සයුරෙහි මහෝදර නම් නා රජෙක් ද වෙසෙති යනුවෙන් මෙම සිදුවීම විස්තර කරයි. බුදුන් වහන්සේගේ ලංකා ගමනත්‍රය සම්බන්ධයෙන් කවි දෙසියයකට අධික ප්‍රමාණයක් යොදා ගනිමින් බොහෝ තොරතුරු වඩාත් විසිතුරු ආකාරයෙන් ඉදිරිපත් කළ පාලි කාව්‍ය ග්‍රන්ථ අතර මෙම කෘතිය ඉතා වැදගත් වේ.

ගම්පොළ යුගයේ රචිත සද්ධර්මාලංකාරය කෘතියෙහි ආරක්ඛඤ්ක වර්ගයෙහි නාගා වස්තුවෙහි සහ සද්ධර්මාරත්නාකරයෙහි දහතුන්වන පරිච්ඡේදයෙහි ද ලංකාවේ නාග ජනතාව පිළිබඳ විස්තර අන්තර්ගත වේ.

මෙම ලංකාද්වීපයෙහි ... දිව්‍යනාගයන්ට වාසස්ථාන වූ නාගභවන තුනෙක් විය. එයින් වඩුන්නාගල නාගභවනයෙහි තිස්කෙළක් නයින්ට නායක වූ චූලෝදර නම් නාරජෙක් වෙසෙයි. කැලණි ගඟ නාගභවනයෙහි විසිකෙළක් නයින්ට නායක වූ මණිඅක්ඛික නම් නා රජෙක් වෙසෙයි. මණිනාග දිවයිනෙහි සමුද්‍ර නාග භවනයෙහි තිස් කෙළක් නයින්ට නායක ව මහෝදර නම් නාරජෙක් වෙසෙයි. මේ තුන් පක්ෂයෙහි නයින් ම ඔවුනොවුන් හා නොවෙනස්ව අන්‍යොන්‍ය සම්බන්ධයෙන් බන්ධුව වසන්නා ... (සද්ධර්මාලංකාරය,403)

අප බුදුන් බුදු වූ පස්වන හවුරුදු බග අවපසළොස්වක දිනයෙහි චූලෝදර මහෝදර නම් දෙමයිල් නා රජුන් දෙදෙනා මිණිපලඟක් නිසා වඩුන්නාගල තිස්කෙළක් නයින් කැලණියෙහි විසිකෙළක් නයින් මණි නාගදිවයින තිස්කෙළක් නයින් හා මේ ජලථලජ ව අසූ කෙළක් පමණ විවිධ නාග සේනවා යුද්ධයට සැරහී ,.. (සද්ධර්මාරත්නාකරය 13 පරි 302-303 පිටු)

ඒ අනුව චූලෝදර, මහෝදර සහ මණිඅක්ඛික නා රජවරුන් බුද්ධ කාලයේ පටන් එනම් ලංකාව ආර්ය ජනාවාස වීමටත් පෙර සිට ම කැලණිය සිය රාජධානිය වශයෙන් පිහිටුවා ගෙන සිටි බවට ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රය සනාථ කරයි. ශ්‍රී ලංකාවට සංඝමිත්තා රහත් තෙරණිය ශ්‍රී මහා බෝධිය වැඩම කළ ගමන පිළිබඳ මහාවංසයේ සඳහන් විස්තරයෙහි ද නාග කුලයේ අය පිළිබඳව ද මෙසේ සඳහන් වේ.

'ඒ මිහිපති වූ මහ රජ තෙම මහ බෝ රක්නා පිණිස අටලොස් කුලයක දෙවියන් ද., අටලොස් කුලයක ඇමැතියන් ද, අට කුලයක බමුණන් ද, අට කුලයක කෙළෙඹියන් ද, ගොපලු කුලයන් හා තරස් කුලයන් ද, කලිඟු කුලයන් ද එසේම පෙහෙර කුලයන් ද, සියලුම සේනා සම්බන්ධ කුලයන් ද නාග යක්ෂයන් සම්බන්ධ කුලයන් ද අට අට දී අභිමතදායි වූයේ ...' (මව. 19.පරි :1-3 ගාථා)

සැලලිහිණි සන්දේශ කතුවරයා ද නාග මානවිකාවන් පිළිබඳ සඳහනක යෙදීමෙන් කැලණියේ නාග කන්‍යාවන් සිටි බව පාඨකයාට දනවයි.

මනහර නා මෙණෙවියනිද ළවැලි පිට
ගෙන මිණි වෙණ තත් නියගින් මැද රුවට
කන එව කියන බුදු ගුණ ගී මියුරු කොට
සැනහෙව කැලණි ගඟබඩ මද කලක් සිට
(සැළලිහිණි සන්දේශය :45 කවිය)

සුන්දර වූ නාග මානවිකාවන් සිනිඳු වැලිතලා මත්තෙහි මැණික් වීණා වාදනය කරමින් ගායනා කරන්නේ බුදු ගුණ බව තොටගමුවේ ශ්‍රී රාහුල හිමි සිය කෘතියෙන් පවසයි. කෝට්ටේ අවදියේ රචිත මෙම සන්දේශයෙහි නාග මානවිකාවන් පිළිබඳ සඳහන් වීමත් ඔවුන් බුදු ගුණ මිහිරට ගායනා කිරීම පිළිබඳව පැවසීමත් නිසා අතීතයේ සිට ම කැලණිය නාග ගෝත්‍රිකයන් ජීවත් වූ යැයි පවතින අදහස තව දුරටත් තහවුරු කිරීමට ඉවහල් වේ.

ලංකාවෙහි උතුරු ප්‍රදේශයෙහි යාපන අර්ධද්වීපයේ වයඹදිග කොටසක් වශයෙන් නාගදීපය හඳුන්වයි. යාපනය වඩමාරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් වල්ලිපුරම් නම් ස්ථානයෙන් සොයාගත් රන්පත වසභ රජතුමාගේ (ක්‍රි. ව. 67-111) කාලයට අයත් යැයි සොයා ගෙන ඇත. ඒ අනුව ක්‍රිස්තුවර්ෂ දෙවන ශතවර්ෂය වන විට දිවයිනේ උතුරු කොටස නාගදීපය යනුවෙන් හැඳින් වූ බව වල්ලිපුරම රන්පතෙහි මෙසේ දැක් වේ.

1. සිධ මහරජ වහයහ රජෙහි අමෙතෙ

2. ඉසිගිරියෙ **නකදිව** බුජමෙනි

3. බදකර අතනෙහි පියගුකතිස

4. විහර කරිතෙ

(යහපතක්ම වේවා, වහ(බ) රජතුමාගේ රාජ්‍ය කාලයෙහි ඉසිගිරිය අමාත්‍යවරයා නාගදීපය පාලනය කරන සමයෙහි පියගුකතිස විසින් බදකරඅතන නම් ස්ථානයෙහි විහාරයක් කරවී ය.) මේ අනුව ක්‍රිස්තුවර්ෂ දෙවන ශතවර්ෂය වන විට නාගදීපය හඳුන්වා ඇත්තේ 'නකදිව' යනුවෙනි.

ලංකා රාජ්‍යය වරින් වර නාග ගෝත්‍රිකයන් අතට පත් වූ බවට සිංහල රාජාවලියේ නාග නාමධාරි රජවරුන් කිහිප දෙනෙකු සිටීමෙන් ද පෙනේ. මුටසීව රජතුමාගේ පුත්‍රයෙකු වන මහානාග රජතුමාගේ මව නාග ගෝත්‍රයට අයත් බව ඇතැම්හු විශ්වාස කරති. බෂාම් සඳහන් කරන පරිදි 'නාග වංශිකයන් හා විවාහ වීමට බොහෝ රජ පෙළපත්වල දැඩි කැමැත්තක් විය. වීර පුරුෂයෙකු හා නාගිනියක සම්බන්ධයෙන් තම රාජ වංශය ආරම්භ වී යැයි ගෞරවයෙන් පවසා සිටියේ ඉන්දීය රාජ්‍ය පෙළපත් එකක් දෙකක් නොවේ' (බෂාම්. 1965: 405). රාසනායගම්ට අනුව මුටසීව රජතුමාගේ බිසව නාග වංශික කාන්තාවකි (1993). රුහුණු මාගම් පත්තුවට පැමිණි මහානාග කුමරයා එම දෙපළගේ පුත්‍රයා ය. ඔහු නාග වංශිකයෙකු ලෙස රටවැසියෝ සැලකූහ. රුහුණු රටේ ආදිම නාග වංශිකයා මුටසීව රජුගේ පුත් ඒ මහානාග බවත් මහානාග උපරජුගේ සොහොයුරු උත්තිය රජුගේ බිසව ද නාග වංශික කාන්තාවක බවත් විශ්වාස කෙරේ.

ලංකාවේ රාජ්‍ය විචාළ රජවරුන්ගේ නාමාවලිය දෙසට අවධානය යොමු කිරීමේ දී බල්ලාටනාග රජතුමා (ක්‍රි.පූ. 109-104), චෝරනාග රජතුමා (ක්‍රි.පූ. 62-50), මහාදාඨික මහානාග රජතුමා (ක්‍රි.ව. 9-21), ඉළනාග රජතුමා (ක්‍රි.ව. 38-44), මහල්ලනාග රජතුමා (ක්‍රි.ව. 135-141), බුජ්ජනාග රජතුමා (ක්‍රි.ව. 193-195), කුඤ්චනාග රජතුමා (ක්‍රි.ව. 195-196), I සිරිනාග රජතුමා (ක්‍රි.ව. 196-215), අභයනාග රජතුමා (ක්‍රි.ව. 237-245), II සිරිනාග රජතුමා (ක්‍රි.ව. 245-247) යනාදි රජවරුන් විශාල සංඛ්‍යාවකගේ නම් ක්‍රිස්තුපූර්ව යුගවල සහ ක්‍රිස්තුවර්ෂාරම්භයේ සඳහන් වේ. එහෙත් ක්‍රිස්තුවර්ෂ හයවන සියවසෙන් පසු මහානාග රජතුමාගේ (ක්‍රි.ව. 561-564) නාමයෙහි පමණක් රජවරුන්ගේ නම් අතර 'නාග' යනුවෙන් භාවිත වී ඇත.

මෙරට රාජ්‍ය විචාළ රජවරුන්ගේ නම් අතර නාග වංශිකයන්ගේ යැයි සිතිය හැකි නම් ද හමුවන අතර ක්‍රිස්තුපූර්ව සහ ක්‍රිස්තුවර්ෂ ආරම්භ වන විට ඔවුන් දිවයින පුරා ම ව්‍යාප්ත සිටි බවට දිවයිනේ නන් දෙසින් හමුවෙන ශිලාලේඛන සාක්ෂ්‍ය දරයි. ඒ අතර රජවරුන්, යුවරජවරුන්, පරුමකවරුන්, තෙරුන් වහන්සේ, ගමණිවරුන්, ගපතිවරුන් සහ ගමිකවරුන් ආදි විවිධ තරාතිරම්වල අය සිටි බවට ද සාක්ෂ්‍ය හමු වේ. පුරාතන බ්‍රාහ්මී සහ පසුකාලීන බ්‍රාහ්මී යුගවලට අයත් රට පුරා ව්‍යාප්ත වී ඇති දහසකට ආසන්න ලෙන්ලිපි අතුරින් විශාල සෙල්ලිපි ප්‍රමාණයක 'නාග' යනුවෙන් සඳහන් වෙන අයුරු මෙසේ සංක්ෂිප්ත කර දැක්විය හැකි ය.

| **දිස්ත්‍රික්කය** | **සෙල්ලිපි සංඛ්‍යාව** | **'නාග' නාම සඳහන් සෙල්ලිපි සංඛ්‍යාව** |
|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කය | 269 | 20 |
| පොලොන්නරුව දිස්ත්‍රික්කය | 51 | 02 |
| වවුනියා දිස්ත්‍රික්කය | 54 | 07 |

| | | |
|---|---|---|
| ත්‍රිකුණාමලය, මඩකලපුව | 182 | 09 |
| අම්පාර දිස්ත්‍රික්ක | | |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 151 | 05 |
| මොනරාගල සහ බදුලු දිස්තික්ක | 55 | 04 |
| රත්නපුර සහ කෑගලු දිස්ත්‍රික්ක | 44 | 01 |
| මහනුවර නුවරඑළි | 73 | 04 |
| මාතලේ දිස්ත්‍රික්ක | | |
| කුරුණෑගල | 181 | 12 |
| පුත්තලම සහ කොළඹ දිස්ත්‍රික්ක | 55 | 02 |
| පසුකාලීන බ්‍රාහ්මී යුගය | 131 | 05 |

මේ අනුව ලෙන් පූජා කළ අය අතුරින් 70කට ආසන්න ප්‍රමාණයක් නාග වංශික සම්බන්ධයක් ඇතැයි විශ්වාස කළ හැකි ආකාරයෙන් 'නාග' යනුවෙන් සඳහන් වී ඇත.

ගෝණවත්ත ( IC vol. I, අංක 813) ලෙන් ලිපියක 'මචුඩික රකඩශ පුතෙ රකඩ අබයෙ ශකඩ අබයශ පුතෙ රකඩ නග රකඩ නගශ පුතෙ රකඩ අබයෙ රකඩ අබයශ පුත ගමණි තිශෙන කරපිතෙ මහශුදශනෙ අගත අනගත චතුදිශ ශගශ පදිට්තෙ ( මහාචූඩික රජතුමාගේ පුත් අභය රජ, අභය රජුගේ පුත්‍ර නාග රජ, නාග රජුගේ පුත්‍ර අභය රජ, අභය රජුගේ පුත්‍ර ගාමණී තිස්ස විසින් කරවන ලද මහාසුදස්සන (නම් වූ ලෙණ) පැමිණි නොපැමිණි සතරදිග සංඝයාට ප්‍රතිෂ්ඨාපිත ය.) මෙම ලිපියෙහි සඳහන් රජවරුන්ගේ නාම පිළිබඳ විග්‍රහයක් සිංහල ශිලාලේඛන සංග්‍රහය කෘතියේ මෙසේ ඉදිරිපත් කර ඇත.

> ගෝණවත්ත (813) සහ දෙමැදඔය (830) ලෙන්ලිපිවල 'මචුඩික' යන නාමය දක්නා ලැබේ. මේ වනාහි මහාචූළික මහාතිස්ස (ක්‍රි.පූ. 76-62) යන නමින් රජ බවට පැමිණි තැනැත්තා ය. ගෝණවත්ත ලිපියෙහි එම රජතුමාගේ සිට පරම්පරා පහකට අයත් පුද්ගලයන් ගැන කියැවී තිබේ. කුටිකණ්ණතිස්ස (ක්‍රි.පූ.42-20), මහාදාඨික මහානාග (ක්‍රි.ව. 9-21) අමණ්ඩගාමිණි අබය (ක්‍රි.ව. 21-30) ලෙන් පූජාව කර ඇත්තේ පසු කී රජතුමාගේ පුත්‍ර ගමණි තිශ විසිනි (මුදියන්සේ, 2000: 18).

මෙම විග්‍රහය අනුව 'නග රජ' යනුවෙන් හඳුන්වා ඇත්තේ අනුරාධපුර යුගයේ රාජ්‍ය විචාළ මහාදාඨික මහානාග රජතුමා බව පැහැදිලි වේ. පෙරියපුලියන්කුලම (IC vol I: අංක

338) ලෙන් ලිපියක '**රඣ නග ඣිත රඣ උති ඣය අබි අනුරදි ච රඣ උති ච කරපිත ශෙ ඉම ලෙණ...** (නාග රජතුමාගේ දුහිතෘ උත්තිය රජතුමාගේ භාර්යා අම්බිකා අනුරාදි සහ උත්තිය රජතුමා විසින් කරවන ලද මෙම ලෙණ...) යනුවෙන් සඳහන් වේ. කුසලානකන්ද (IC vol. I, අංක 389) ලෙන් ලිපියක ද රජ සහ උප රජ කෙනෙකු පිළිබඳ තොරතුරු සඳහන් වේ. එනම් '**උපරඣ නග පුතෙ රඣ අබයෙ නම තශ පුතෙ ගමණි තිශෙ නත තෙන කරිතෙ ශුදශනෙ ශගශ**' (උපරජ නාගගේ පුත්‍ර අබය රාජ වේ. ඔහුගේ පුත් ගාමිණි තිස්ස විසින් කරවන ලද සුදස්සන නම් (ලෙණ) සංඝයාටය ) යනුවෙනි. මොට්ටයකල්ලු (IC vol I: අංක 487) ලෙන් ලිපියක '**දසභතික රන ඣවක නය උපරඣ නග උපරඣ නගහ මරුමකනකෙ මහ පසයීකෙ අභය රඣහ පුතෙ ගමණි තිසහ විහර අගත අනගත භිකු සගස නියතෙ ...** ( දසබෑ රජුන්ගේ ජාවක නියමු උපරාජ නාගය. උපරාජ නාගගේ මුනුබුරු මහපසයීක අභය රජුගේ පුත්‍ර ගාමණි තිස්සගේ විහාරය පැමිණි නොපැමිණි භික්ෂු සංඝයා වහන්සේට පමුණුවන ලදී.) තව ද බඹරගල, පතහමුල්ලේ විහාර යනාදි ස්ථානවල ඇති ලෙන් ලිපි අතර රජ යුවරජ තනතුරු දැරූ 'නග' නමින් ව්‍යවහාර වූ පුද්ගල නාම ඇත. රටේ ප්‍රධාන රජවරුන් සහ ප්‍රාදේශිය රජවරුන් අතර නාග රජවරුන් සිටි බවට මෙබඳු ලෙන් ලිපි මගින් තොරතුරු සොයා ගත හැකි ය.

මිහින්තලේ කන්ද (IC vol. I, අංක 11) ලෙන් ලිපියක '**පරුමක නග පුත අසලිය ලෙණෙ අගත අනගත චතු දිශික සගයෙ** (ප්‍රමුඛ නාගගේ පුත්‍ර අසලිගේ ලෙණ ආ නො ආ සතරදිග සංඝයාටය) යනුවෙන් ද '**පරුමක බතකරහ නග කුලහ ච ගොති මතහ ච ලෙණෙ**' (ප්‍රමුඛ භත්තකාරක නාගගේ කුලයේ ද ගොති මතගේ ද ලෙණ) වශයෙන් බඹරගස්තලාව (IC vol. I, අංක 507) ලෙන් ලිපි අතර පරුමක අරක්කැමි නාගගේ කුලය යනුවෙන් ද සඳහන් වී ඇත. නුවරකන්ද (IC vol. I, අංක 922) ලෙන් ලිපි අතර '**පරුමක උදයහ නගදතහ ලෙණෙ ශගශ**' (පරුමක උදයගේ සහ නාගදත්තගේ ලෙණ සංඝයාටය) යනුවෙන් සඳහන් වේ. තවත් ලෙන් ලිපි කිහිපයක ම 'පරුමක' හෙවත් ප්‍රධානියා යන අරුත් දෙන නාග යනුවෙන් සඳහන් ලෙන් ලිපි හමු වේ.

ලෙන් පූජා කිරීමෙන් ම බෞද්ධාගමට සමීප බව අනාවරණය වුව ද ඒ නම් අතර භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස පිළිබඳ පවා තොරතුරු සඳහන් වේ. රජගල (IC vol. I, අංක 451) ලෙන් ලිපි අතර '**නගශෙන තෙරශ ශුදශනෙ**' (නාගසේන තෙරුන්ගේ සුදස්සන (නම්) ලෙණ) යනුවෙන් ලිපියක් ද එහි ම (IC vol. I, අංක 458) '**නග තෙරහ ලෙණෙ ඉදසල ගොහ**' (නාග තෙරුන්ගේ ඉන්දසාල ගුහා (නම්) ලෙණ යනුවෙන් ද සිතුල්පව්ව (IC vol. I, අංක 602) '**නගශෙන තෙරශ ලෙණ ශගශ**' වශයෙන් ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ වෙලන්ගොල්ල (IC vol. I, අංක 973) ලෙන් ලිපි අතර පූජ්‍ය නාගගේ ද ගෘහපති අනුරාධගේ කුලයට අයත් වූ ද සුප්පතිට්ඨ නම් ලෙණ සංඝයාට දානයකි (**අශිය නගශ ගපති අනුරද කුලශ ච දනෙ ශුපදිටි ලෙණෙ ශගශ**) යනුවෙන් සඳහන් වී ඇත.

වවුනියා දිස්ත්‍රික්කයේ පෙරියපුළියන්කුලම (IC vol. I, අංක 366) ලෙන් ලිපි අතර **'උපශක නගහ ලෙණෙ ශගශ දිනෙ'** (උපාසක නාගගේ ලෙණ සංඝයාට දෙන ලදී) යනුවෙන් ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරව මයිලෑව (IC vol. I, අංක 1035) ලිපි අතර උපාසක මහා නාගගේද උපාසිකා තිස්සාගේ ද ලෙණ (**උපශක මහනගහ ච උපශක තිශහ ච ලෙණෙ**) යනුවෙන් නාග සම්භවයක් ඇතැයි සිතීමට තුඩුදෙන ආකාරයේ පුද්ගල නාම සඳහන් ව ඇත. ඇඹුල්අඹේ (IC vol. I, අංක 834) ලෙන් ලිපියක **'උපශික නගදතය ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ)** යනුවෙන් 'උපාශිකා නාගදත්තා' පිළිබඳ සඳහනක් ද වැලඑල්ලුගෙ ාඩකන්ද (IC vol. I, අංක 724) ලිපියක **'තිශමහරකඩහ ශෙනපිතිය අගිදතහ බරියය ශෙනපිති පරුමක පුශදෙවහ ඣිතය උපශික නගය ලෙණෙ ශගශ දිනෙ'** (තිස්ස මහ රජතුමාගේ සේනාපති අග්ගිදත්තගේ භාර්යා සේනාපති ප්‍රමුඛ ඵුස්සදේවගේ දුව වූ උපාසිකා නාගාගේ ලෙණ සංඝයාට දෙන ලදී) **යනුවෙන් දක්වා ඇති අතර එහිම අනෙක් ලිපියක** (IC vol. I, අංක 725) **'ශෙනපිති පරුමක පුශදෙවහ ඣිත නග ශමණිය මහ ලෙණෙ ශගශ'** (සේනාපති ප්‍රමුඛ ඵුස්සදේවගේ දුව වූ නාගා මෙහෙණියගේ මහ ලෙණ සංඝයාටය) යනුවෙන් සඳහන් වේ. මෙම ලිපිය පිළිබඳ සිංහල ශිලාලේඛන සංග්‍රහයේ මෙසේ විග්‍රහ කර ඇත.

> 'අංක 724 ලිපියෙහි පරුමක පුශදෙව නමැත්තෙක් පැනෙයි. ඔහුට සෙනපිති නම් තනතුරක් තිබිණි. ඔහුගේ දියණියගේ නම නග (නාගා) බව කිය වේ. ඇයගේ සැමියා තිශ මහ රජුගේ සෙන්පති අගිදත නමැත්තා ය. මේ නම් දුට්ඨගාමිණී අභය (ක්‍රි.පූ. 161-137) රජතුමාගේ කාලයට අයත් කළ හැකි ලිපියකි. ඵුස්සදේවගේ නාගා නම් දියණිය පසුකලක දී පැවිදි ව සසුන්ගත වූ බව (අංක 725) ලිපියෙහි දැක්වෙයි (මුදියන්සේ, 2000, පි. 16).

මිහින්තලේ ( IC vol. I, අංක 81) ලෙන් ලිපියක ස්වර්ණකාර නාගගේ පුත්‍ර දේවගේ ලෙණ පැමිණි නොපැමිණි සතර දිශාවෙහි සංඝයාට පූජා කළ බව (**තලදර නගය පුත දෙවහ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ** ) සඳහන් වේ. බඹරගස්තලාව ( IC vol. I, අංක 522) ලිපියක (**බදත මිතෙන මපිත නගපවත ශෙනශනෙ)** හදන්ත මිත්ත නමැත්තෙකු විසින් නිර්මාණය කරන ලද 'නාග පබ්බත' නම් සේනාසනයක් පිළිබඳ සඳහන් වේ. ගල්ගමුව ලෙන් ලිපියෙහි ( IC vol. I, අංක 81) **'මණිකර නග ඉහ ...'** (මණිකාර නාග මෙහි) යනුවෙන් සඳහන් වේ. මෙපමණක් නොව ගම්පතින් පිළිබඳ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බ්‍රාහ්මණයාගම ලෙන්ලිපිවල ද පිළිවෙළින් **ගමික නගහ...** ( IC vol. I, අංක 149) **ගමික නග පුත...** ( IC vol. I, අංක 81) යනුවෙන් ද බඹරගස්තලාව( IC vol. I, අංක 513) ලිපියක **'ගමික නග පුත යශ තෙරශ ...'** යනුවෙන් සඳහන් තොරතුරු හමු වේ. මිහින්තලේ ආනෙයිකුට්ටිකන්ද ( IC vol. I, අංක 85) ලෙන්ලිපියක **'ගපති නගපුත තිශහ ලෙණෙ ශගශ** (ගෘහපති නාගගේ පුත්‍ර තිස්සගේ ලෙණ සංඝයාටය). මේ ආකාරයට ලෙන් ලිපි ව්‍යාප්තිය දෙසට අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ නාග ගෝත්‍රිකයන් සිය පුද්ගල නාම සඳහා 'නාග' යන පදය භාවිත කළේ නම් ක්‍රිස්තුපූර්ව සහ ක්‍රිස්තුවර්ෂාරම්භයේ රට පුරා ඔවුන් ජීවත් වූ බවට අනුමාන කළ හැකි ය. එමෙන් ම නාග වංශිකයන් බෞද්ධාගම අදහන පිරිසක් වූ බවට

ලෙන් පූජා කිරීම, සේනාසන ඉදි කිරීම, සසුන්ගත වීම සහ උපාසක පිරිසක් වශයෙන් ජීවිත ගත කළ බව සඳහන් වීමෙන් පැහැදිලි වේ.

මේ අනුව සාහිත්‍ය, ඓතිහාසික මූලාශ්‍රයවලින් සහ අභිලේඛන තොරතුරුවලින් සමාජ ආර්ථික සංස්කෘතික දේහයේ සිදු වූ වෙනස්කම් එනම් සමාජයේ දියුණුව හෝ වර්ධනය ආදි කරුණු පිළිබඳ සාකච්ඡා කෙරේ. සමාජයේ ආර්ථික දේශපාලන තත්ත්වයන් සහ වැසියන් ඒ කෙරෙහි දක්වූ සම්බන්ධයේ ස්වභාවය මත සංස්කෘතියේ වර්ධනය හෝ ගතිකත්වය තීරණය වන බව මෙමගින් පෙනී යයි. විජයගේ පැමිණීමට පෙර නාගයන් පිළිබඳ ලංකා ඉතිහාසයේ සඳහන් වෙතත් ඉන් පසුව ඔවුන් පිළිබඳව අපේ ඉතිහාසය සියවස් කිහිපයකට පසු ව නිහඬ වේ. ලංකාවේ කැලණිය, නාගදීපය සහ වඩුන්නාගල වැනි ප්‍රදේශ පාලනය කරමින් ප්‍රබලව විසූ නාගයන් පිළිබඳ ව ඉතිහාසය නිහඬ වීම විමසිය යුතු වැදගත් ප්‍රශ්නයකි. විජය පරපුර හා සම්මිශ්‍රණය වූ නාගයන් ද සංඝමිත්තා රහත් තෙරණිය සමඟ ලංකාවට පැමිණි නාග ජනයා ද ලංකා රාජ්‍යයේ නියම උරුමක්කරුවන් ලෙස සිංහල නාමයෙන් පෙනී සිටීම මේ සඳහා හේතුවිය හැකි ය. (කොඩ්රිංටන්ගේ 'සංක්ෂිප්ත ලංකා ඉතිහාසය' කෘතියේ රාජ නාම ලේඛනය ආශ්‍රයෙන් රාජ්‍ය වර්ෂ යොදා ඇත.)

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කොඩ්රිංටන්, එච්. ඩබ්. (2009) **සංක්ෂිප්ත ලංකා ඉතිහාසය.** බත්තරමුල්ල : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. (1951). (සංස්.) **පූජාවලිය.** බත්තරමුල්ල : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

පඤ්ඤාලෝක හිමි, දෙනියායේ. (2001). (සංස්.) **ප්‍රාචීන මධ්‍යම විභාගයට නියමිත සමන්තකූට වණ්ණනා.** ප්‍රකාශනය : සඳහන් නොවේ.

බෂාම්, ඒ.එල්. (1965). **අසිරිමත් ඉන්දියාව.** කොළඹ : රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1959). **ඌනපූර්ණ සහිතො මහාවංසො.** කොළඹ :ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

මුදියන්සේ, නන්දසේන. (2000). **සිංහල ශිලාලේඛන සංග්‍රහය.** කොළඹ : ඇස්.ගොඩගේ ප්‍රකාශකයෝ.

වනරතන හිමි, කඹුරුපිටියේ. (1967) ''කැලණියේ යටගියාව''ලබුහේන්ගොඩ චන්ද්‍රරතන හිමි (සංස්.) **ගයිගර් සමරුව.** 57-63 පිටු, ප්‍රකාශනය : ධාරා පාලි සගරා සම්පාදක මණ්ඩලය

වනරතන හිමි, කඹුරුපිටියේ. (1994). **මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය.** මාතර : කතෘ ප්‍රකාශන.

වාච්චගේ, එස්. (වර්ෂය සඳහන් නොවේ). 'මාතර ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව. 1500 දක්වා)'. සුගත් වටගෙදර, පණ්ඩුල ඇඳගම, සුමිත් රණසිංහ (සංස්.) **මාතර වංශය (ප්‍රථම භාගය)** 179-213 පිටු, බත්තරමුල්ල : සංස්කෘතික කටයුතු සහ ජාතික උරුමයන පිළිබඳ අමාත්‍යංශය

විතාරණ විණී, (1974). **සාහිත්‍යයෙන් භූගෝලය : ලංකාව.** ගල්කිස්ස : කතෘ ප්‍රකාශන

සුගුණසාරාභිධාන හිමි, කොලොන්නාවේ. (1923). (සංස්.) **සද්ධර්මරත්නාකරය.** හෝමාගමඃ විද්‍යා ප්‍රකාශ යන්ත්‍රාලය

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම. (1996). (සංස්.) **සද්ධර්මාලංකාරය.** බත්තරමුල්ල : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

Paranavitana, S. (1983) Inscription of Ceylon Vol. I (Early Brahmi Inscriptions). Colombo:

Department of Archaeology.

Rasanayagam, M.C. (1984) Anceint Jaffna. New Delhi: Asian Educational Services

http://www.lankadeepa.lk/features/ **(නාග සාපය), සුජිත් අක්කරවත්ත, 2014 දෙසැම්බර් 14**

https://roar.media/sinhala/main/features/naga-tribe-in-old-ceylon 2021-3-12 **(හෙළ නාග පරපුරේ තතු මෙන්න)** Vimarsha Bandaranayake

https://si.wikibooks.org/wiki/ *(*ඩබ්. ඒ. සිල්වා 1947 දෙසැම්බර් 18 බම්බලපිටිය සිරිනිකේතනයේ දී)

*https://si.wikipedia.org/wiki/* සිරිලක නාග සංකල්පය